# සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය
# நலன்புரி நன்மைகள் சபை
# WELFARE BENEFITS BOARD

## මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
## රැකියා පුරප්පාඩු

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කර ඇති සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ පහත සඳහන් පුරප්පාඩු සඳහා සුදුසුකම් සහ පළපුරුද්ද සහිත ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. **මෙම තනතුරු සඳහා බඳවාගැනීම් කොළඹ ප්‍රධාන කාර්යාලය සඳහා පමණක් සිදු කරනු ලබන බව කරුණාවෙන් සලකන්න.**

| අංකය | තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව | සුදුසුකම් |
|---|---|---|---|
| 01 | නියෝජ්‍ය සුබසාධක ප්‍රතිලාභ කොමසාරිස් (මූල්‍ය කළමනාකරණය) MM -1-3 | 02 | <u>**සුදුසුකම් සහ පළපුරුද්ද**</u><br><br><u>**බාහිර අයදුම්කරුවන්: (පහත 1 හෝ 2)**</u><br><br>1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ගිණුම්කරණය, මූල්‍ය කළමනාකරණය, වාණිජ විද්‍යාව, ව්‍යාපාර අධ්‍යයනය, යන ක්ෂේත්‍රවලට අදාළ උපාධියක් හෝ තනතුරේ විෂය ක්ෂේත්‍රයට අදාළ වෙනත් ඕනෑ ම උපාධියක් ලබා තිබීම.<br><br>සහ<br><br>ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසුව, තනතුරට අදාළ ක්ෂේත්‍රයේ සුදුසුකම් ලැබීමෙන් පසු අවම වශයෙන් වසර හතරක (04) පළපුරුද්දක් ලබා තිබීම.<br>හෝ<br><br>2. තනතුරේ විෂය ක්ෂේත්‍රයට අදාළ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක (Chartered Institute) අන්තර්මධ්‍යම පරීක්ෂණය (Intermediate Examination) සමත් වී තිබීම සහ තනතුරට අදාළ ක්ෂේත්‍රයේ සුදුසුකම් ලැබීමෙන් පසු අවම වශයෙන් වසර හතරක (04) පළපුරුද්දක් ලබා තිබීම.<br><br><u>**අභ්‍යන්තර අයදුම්කරුවන්: (පහත 1 හෝ 2)**</u><br><br>**1.** බාහිර අයදුම්කරුවන් සඳහා ඉහතින් සඳහන් කරන ලද අවශ්‍ය සුදුසුකම් සපුරා තිබීම<br>**හෝ**<br>**2.** තනතුරේ විෂය ක්ෂේත්‍රයට අදාළ ව කළමනාකාර බණ්ඩයේ (MM1-1) තනතුරක අවම වශයෙන් වසර තුනක (03) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම<br><br>**වැටුප් පරිමාණය:-** 96,650 - 10 x 2,480 - 15 x 3,450 – 173,200 (MM 1-3)<br>**මූලික වැටුප් පියවර:- රු.85,896/-** (අංක 2026/01 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ II වන උපලේඛනයට අනුව) |

Gazette.lk AMBITIONS REALIZED

| | | | |
|---|---|---|---|
| | | | (අනුමත රජයේ දීමනා + භාණ්ඩාගාර චක්‍රලේඛයන්ට අනුකූල ව සන්නිවේදන පහසුකම් )<br><br>**කාර්යයන් සහ වගකීම්**<br><br>• සෑම මාසයක ම සුබසාධක ප්‍රතිලාභ ලැබීමට සුදුසුකම් ලබන මිලියන 02 කට ආසන්න ප්‍රතිලාභීන්ගේ ගිණුම් වෙත දීමනා ගෙවීමට අදාළ කටයුතු සංවිධානය කිරීම.<br>• වකුගඩු ආධාර, වැඩිහිටි දීමනා, ආබාධිත දීමනා ලබන්නන්ගේ ගිණුම් වෙත අදාළ ගෙවීම් සිදු කිරීම.<br>• සෑම මාසයක ම ලැබිය යුතු ගෙවීම්වලට අදාළ මාසික ගෙවීම් වාර්තා පිළියෙල කිරීම සහ අදාළ ප්‍රතිලාභීන්ට එකී දීමනා ලැබෙන්නේදැයි පසු පිරික්සුම් (follow-up) සිදු කිරීම.<br>• බැංකු ගිණුම් මාරු කිරීම් සම්බන්ධයෙන් ලැබෙන නව ඉල්ලීම් පිළිබඳ කටයුතු කිරීම.<br>• තොරතුරු සඟවා ප්‍රතිලාභ ලබාගන්නා බවට වාර්තා වන විට, ඒ පිළිබඳ ව විමර්ශනය කර එම ප්‍රතිලාභ ලබා දීම නැවැත්වීමට අවශ්‍ය පියවර ගැනීම.<br>• වංචනික ලෙස දීමනා ලබා ගෙන ඇති අවස්ථාවල දී, එකී මුදල් නැවත අය කර ගැනීමට කටයුතු යෙදීම සහ ඉහත දීමනා ලබා දීමට අදාළ ව බැංකු සමඟ අවශ්‍ය සම්බන්ධීකරණය සිදු කිරීම.<br>• ප්‍රතිලාභ ගෙවීම් සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල සමඟ සමීප සම්බන්ධීකරණයක් පවත්වාගෙන යාම.<br>• මූල්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කිරීම සඳහා වාර්ෂික සංඛ්‍යාලේඛන ඉදිරිපත් කිරීම.<br>• අවශ්‍යතාවය පරිදි ප්‍රසම්පාදන කටයුතු මෙහෙයවීම. |
| 02 | සහකාර සුබසාධක කොමසාරිස් (සන්නිවේදන)<br><br>MM -1-1 | 01 | **සුදුසුකම් සහ පළපුරුද්ද**<br><br>**බාහිර අයදුම්කරුවන්**<br><br>1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළි ගත් ජනසන්නිවේදනය, අලෙවිකරණය, ව්‍යාපෘති කළමනාකරණය, ව්‍යාපාර පරිපාලනය යන ක්ෂේත්‍රවලට අදාළ උපාධියක් හෝ තනතුරේ විෂය ක්ෂේත්‍රයට අදාළ වෙනත් ඕනෑ ම උපාධියක් ලබා තිබීම.<br>සහ<br>ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු ව, තනතුරට අදාළ ක්ෂේත්‍රයේ සුදුසුකම් ලැබීමෙන් පසු අවම වශයෙන් වසරක (01) පළපුරුද්දක් ලබා තිබීම.<br><br>**අභ්‍යන්තර අයදුම්කරුවන්:**<br><br>**1.** බාහිර අයදුම්කරුවන් සඳහා ඉහතින් සඳහන් කරන ලද අවශ්‍ය සුදුසුකම් සපුරා තිබීම<br><br>**වැටුප් පරිමාණය:-** . 91,690 - 10 x 2,480 - 15 x 3,450 - 168,240 (MM 1-1)<br>**මූලික වැටුප් පියවර:-** රු..81,710/- (අංක 2026/01 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ II වන උපලේඛනයට අනුව)<br><br>(අනුමත රජයේ දීමනා + භාණ්ඩාගාර චක්‍රලේඛයන්ට අනුකූල ව සන්නිවේදන පහසුකම් ) |

Gazette.lk AMBITIONS REALIZED

| | | | |
|---|---|---|---|
| | | | <u>**කාර්යයන් සහ වගකීම්**</u><br>• සහනාධාර වැඩසටහන පිළිබඳ අවශ්‍ය තොරතුරු රැස්කිරීම පිළිබඳව දැනුවත් කිරීමට සහ රැස්වීම් කැඳවීමට අදාළ සියලු ම රජයේ නිලධාරීන් සම්බන්ධ කර ගැනීම.<br>• සියලු ම මාධ්‍ය ( ශ්‍රව්‍ය, දෘශ්‍ය සහ මුද්‍රිත) යොදා ගනිමින් වැඩසටහන් සකස් කිරීම සහ ප්‍රචාරය කිරීම මගින් මහජනතාව සහ ප්‍රතිලාභීන් දැනුවත් කිරීම.<br>• අස්වැසුම වැඩසටහනට අදාළ වැඩසටහන් වාර්තා සකස් කිරීම සහ ඒවා මහජනතාව අතර ප්‍රචාරය කිරීම.<br>• කාලීන ව සිදු කරනු ලබන වෙනස්කම් පිළිබඳව මහජනතාව, ප්‍රතිලාභීන්, රජයේ නිලධාරීන්, මාධ්‍යවේදීන් සහ සමාජ මාධ්‍ය දැනුවත් කිරීම.<br>• ආයතනික මට්ටමින් නවෝත්පාදක සහ නිර්මාණාත්මක සන්නිවේදන උපායමාර්ග සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳ කැපී පෙනෙන නිපුණතාවයක් තිබීම. |
| 03 | අභ්‍යන්තර විගණක | 01 | <u>**සුදුසුකම් සහ පළපුරුද්ද**</u><br><br><u>**බාහිර අයදුම්කරුවන්: (පහත 1 හෝ 2)**</u><br>1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළි ගත් ගිණුම්කරණය, මූල්‍ය කළමනාකරණය, වාණිජ විද්‍යාව, ව්‍යාපාර අධ්‍යයනය යන ක්ෂේත්‍රවලට අදාළ උපාධියක් හෝ තනතුරේ විෂය ක්ෂේත්‍රයට අදාළ වෙනත් ඕනෑ ම උපාධියක් ලබා තිබීම.<br>සහ<br>ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු ව, තනතුරට අදාළ ක්ෂේත්‍රයේ සුදුසුකම් ලැබීමෙන් පසු අවම වශයෙන් වසරක පළපුරුද්දක් ලබා තිබීම.<br>2. තනතුරේ විෂය ක්ෂේත්‍රයට අදාළ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක (Chartered Institute) අන්තර්මධ්‍යම පරීක්ෂණය (Intermediate Examination) සමත් වී තිබීම සහ තනතුරට අදාළ ක්ෂේත්‍රයේ සුදුසුකම් ලැබීමෙන් පසු අවම වශයෙන් වසරක පළපුරුද්දක් ලබා තිබීම.<br><br><u>**අභ්‍යන්තර අයදුම්කරුවන්**</u><br>**1.** බාහිර අයදුම්කරුවන් සඳහා ඉහතින් සඳහන් කරන ලද අවශ්‍ය සුදුසුකම් සපුරා තිබීම<br><br>**වැටුප් පරිමාණය:-** . 91,690 - 10 x 2,480 - 15 x 3,450 - 168,240 (MM 1-1)<br>**මූලික වැටුප් පියවර:-** රු. Rs.81,710/- ((අංක 2026/01 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ II වන උපලේඛනයට අනුව)<br><br>(අනුමත රජයේ දීමනා + භාණ්ඩාගාර චක්‍රලේඛයන්ට අනුකූල ව සන්නිවේදන පහසුකම් ) |

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED

| | | | |
|---|---|---|---|
| | | | **කාර්යයන් සහ වගකීම්**<br>• දෙපාර්තමේන්තුවේ කටයුතු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, මාර්ගෝපදේශ සහ චක්‍රලේඛවලට අනුකූල ව සිදු වන්නේ දැයි පරීක්ෂා කිරීම.<br>• වාර්ෂික අභ්‍යන්තර විගණන සැලසුම පිළියෙල කිරීම<br>• විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම.<br>• ප්‍රාථමික ඇගයීම් වාර්තා ඇතුළු ව විගණන වාර්තා ඉදිරිපත් කිරීම.<br>• විසර්ජන ගිණුම (Appropriation Account), අත්තිකාරම් 'බී' ගිණුම (Advance B Account) සහ තැන්පතු ගිණුම් ඇතුළු ගිණුම් අංශයේ ක්‍රියාකාරකම් පරීක්ෂා කිරීම.<br>• අභ්‍යන්තර විගණන සහ පාලනයන්හි සඵලතාවය ඇගයීම.<br>• දෙපාර්තමේන්තුවේ මූල්‍ය වාර්තාවල නිවැරදිතාව තීරණය කිරීම.<br>• කාර්ය මණ්ඩලයේ කාර්යසාධනයේ සාර්ථකත්වය සහ ගුණාත්මකභාවය පරීක්ෂා කිරීම.<br>• දෙපාර්තමේන්තුව සතු රජයේ දේපළ හා වත්කම්වල ආරක්ෂාව පරීක්ෂා කිරීම.<br>• මෙම දෙපාර්තමේන්තුවට අදාළ ව විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන පරීක්ෂණ සඳහා අවශ්‍ය තොරතුරු සැපයීම සහ අදාළ නිලධාරීන්ට සහාය වීම.<br>• අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් වරින් වර පවරනු ලබන වෙනත් රාජකාරි ඉටු කිරීම. |

**වයස් සීමාවන්:**

**නියෝජ්‍ය සුබසාධක කොමසාරිස්, සහකාර සුබසාධක කොමසාරිස්වරුන් සහ අභ්‍යන්තර විගණක**

වයස අවුරුදු 22 ට නො අඩු සහ අවුරුදු 45 ට නො වැඩි විය යුතු ය. ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ.

**සාමාන්‍ය කොන්දේසි:**

❖ වැටුපෙන් 8% ක් සේවක අර්ථසාධක අරමුදලට (EPF) දායක විය යුතු අතර, සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් රජයේ දායකත්වය ලෙස 12% ක් ගෙවනු ලැබේ. තව ද, සේවක භාරකාර අරමුදල (ETF) වෙනුවෙන් 3% ක දායකත්වයක් සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් ගෙවනු ලැබේ.

❖ පත්වීම් සිදු කරනු ලබන්නේ සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා කුසලතා අනුපිළිවෙල අනුව ය.

❖ මෙම තනතුරු ස්ථිර වේ. තනතුරුවල ස්ථිර කිරීමට පෙර වසර 03 ක පරිවාස කාලයකට යටත් වේ.

**මාසික වේතනය:**

❖ MM 1-3 - 2025 රු. [96,650 - 10 x 2,480 - 15 x 3,450 – 173,200] + රජය විසින් අනුමත දීමනා

❖ MM 1-1-2025 රු. [91,690 – 10 x 2,480 - 15 x 3,450 – 168,240] + රජය විසින් අනුමත දීමනා

වැටුපෙන් 8% ක් සේවක අර්ථසාධක අරමුදලට (EPF) දායක විය යුතු අතර, සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් රජයේ දායකත්වය ලෙස 12% ක් ගෙවනු ලැබේ. තව ද, සේවක භාරකාර අරමුදල (ETF) වෙනුවෙන් 3% ක දායකත්වයක් සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් ගෙවනු ලැබේ.

අයදුම්පත පහත සඳහන් වෙබ් අඩවිවලින් බාගත කරගත හැක:

❖ http:// www.treasury.gov.lk/web/ministry-of-finance/vacancies

❖ https:// www.wbb.gov.lk/web/si/jobs

❖ අයදුම්පත ඇතුළත් කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතු අතර, එය **2026.10.05....** දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් **"කොමසාරිස්, සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය, ජේ. ආර්. ජයවර්ධන කේන්ද්‍රය, අංක 191, ධර්මපාල මාවත, කොළඹ 07."** යන ලිපිනයට යොමු කළ යුතු ය.

Gazette.lk AMBITIONS REALIZED

- ❖ රාජ්‍ය / සංස්ථා අංශයේ ආයතනවල අයදුම්කරුවන් සිය අයදුම්පත් තම ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් යොමු කළ යුතු ය. ප්‍රමාද වී ලැබෙන, අසම්පූර්ණ හෝ අවසාන දිනයට පසු ව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

- ❖ අයදුම්කරුවෙකු තනතුරු එකකට වඩා වැඩි ගණනක් සඳහා අයදුම් කරන්නේ නම්, **එක් එක් තනතුර සඳහා සහතික පත්‍රවල පිටපත් සමඟ වෙන වෙන ම කවරවල බහා අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය.**

- ❖ මෙම දැන්වීම අවලංගු කිරීම, සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ අයදුම්කරුවන් කෙටි ලැයිස්තුගත කිරීම (shortlisting) සම්බන්ධ සියලු ම හිමිකම් සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ සභාපතිවරයා සතු වේ.

**කොමසාරිස්**
**සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය**
**මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය.**

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED